# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk

e-mail: psc.cp.gov@gmail.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/MSO/TRA/M/2025 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.05.28 |

මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික නොවන ස්ථානමාරු.</u>

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමණාකරන සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියේ නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කළමණාකරණ සේවා නිලධාරීන්, තාක්ෂණ සේවයේ නිලධාරීන් සහ මෙම කොමිෂන් සභාව විසින් ස්ථාන මාරු බලධාරිත්වය දරණ සියලුම සේවාවන්ගේ නිලධාරීන්ගේ වාර්ෂික නොවන ස්ථාන මාරු සම්බන්ධයෙන්, අදාළ නිර්දේශයන් සහිතව මෙම කොමිෂන් සභා කාර්යාලය වෙත යොමු කරන ස්ථාන මාරු අයැදුම්පත්‍ර පිළිබඳව සළකා බලන ලද ගරු කොමිෂන් සභාව, එම ඇතැම් ස්ථාන මාරු ඉල්ලීම් සාධාරණ නොවන මෙන්ම එම ස්ථාන මාරු සඳහා අනුමැතිය ලබාදීම තුළ වාර්ෂික ස්ථාන මාරු ලැබීමට නියමිත, සුදුසුකම් ලබන නිලධාරීන්ට අගතියක් සිදුවන බවට නිරීක්ෂණය කර ඇත.

02. නගරාශ්‍රිත කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් අතර සුහද ස්ථාන මාරු ලබාගැනීම තුළ නුවරඑළිය, වලපනේ, මිණිපේ, විල්ගමුව, ලග්ගල, ගඟ ඉහළ කෝරළේ, කොත්මලේ, නාඋල, උඩුදුම්බර, පන්විල යනාදී දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි කාර්යාලයන්හි සේවයේ නියුතු නිලධාරීන්ට නගරාශ්‍රිත කාර්යාල වෙත වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලබාගැනීමට ඇති අවස්ථාව අහිමි වී යන බව ද නිරීක්ෂණය කර ඇත.

03. ඒ අනුව, පහත නිර්ණායක පිළිබඳ අවධානය යොමු කර සුදුසුකම් සහිත නිලධාරීන්ගේ වාර්ෂික නොවන ස්ථාන මාරු අයැදුම්පත්‍ර මෙම කොමිෂන් සභා කාර්යාලය වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

i. මීට පෙර වර්ෂයක වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා දැනටත් පෙර සේවා ස්ථානයෙන් නිදහස් නොවූ නිළධරයෙක්ද යන්න
ii. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික නොවන ස්ථාන මාරු නියෝගයක් ලද නිලධරයෙක්ද යන්න
iii. පළමු පත්වීම ලද නවක නිලධරයකු නම්, පත්වීම් ලිපිය අනුව මුල් සේවා ස්ථානයේ අවුරුදු 03 ක සේවා කාලය සම්පූර්ණ කර ඇත්ද යන්න (මෙම කරුණ ස්ථාන මාරු ඉල්ලුම් කිරීමේදී සුදුසුකම සළකා බලන නිර්ණායකයක් ලෙස පමණක් සළකා බලන බව)
iv. ස්ථාන මාරු ඉල්ලුම් කරනු ලබන ආයතනයේ මීට පෙර සේවය කර තිබේද හා එසේ නම් එහි සේවා කාලය
v. වර්තමාන සේවා ස්ථානයත්, ස්ථාන මාරු ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථානයත් අතර දුර ප්‍රමාණය
vi. ස්ථාන මාරු ඉල්ලීමට හේතු වූ කාරණා පිළිබඳ පැහැදිලි කිරීමක්
vii. වෛද්‍ය හේතු මත ස්ථාන මාරු ඉල්ලුම් කිරීමේදී, යොමු කරන වෛද්‍ය වාර්තා, විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය වාර්තාවන් විය යුතු අතර, ඒවායේ පිටපත්, නිලධරයා වර්තමානයේ සේවය කරන ආයතනයේ ප්‍රධානී විසින් සහතික කර යොමු කළ යුතුය(අදාළ වෛද්‍ය වාර්තා සනාථ කර තිබිය යුතුය).

04. ඒ අනුව, ඉහත සියළුම කරුණු සමඟ ඔබේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ස්ථාන මාරු අයදුම්පත් පිළිබඳව වෙන වෙනම සලකා බැලීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් අදාළ තීරණය ලබා දෙන බවද වැඩි දුරටත් සඳහන් කරමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

සුජානි ආර්.විජේතුංග,
ලේකම්(වැ/බ),
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.